සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ............................................................ විභාග අංකය :- ....................

## I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ 1-20 දක්වා දී ඇති ප්‍රශ්න සියල්ලේ ම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(01) අතීතයේ අපේ රටේ සිටි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ මින් කුමක් ද?
(1) විවිධ කර්මාන්තවල නිරත වීම (2) වෙළෙඳාම සිදුකිරීම
(3) කෘෂිකර්මාන්තයේ යෙදීම (4) ධීවර කර්මාන්තය සිදුකිරීම

(02) ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස සැලකෙන්නේ,
(1) හේන් ගොවිතැනයි. (2) වී ගොවිතැනයි.
(3) පොල් වගාවයි. (4) තේ වගාවයි.

(03) පුරාණ කාලයේ මෙරට ජනතාව කන්න තුනක් වී වගාකළ බව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) බුද්ධන්නේහෙල සෙල්ලිපිය (2) තෝනිගල සෙල්ලිපිය
(3) වේවැල්කැටිය සෙල්ලිපිය (4) ගල්පොත සෙල්ලිපිය

(04) මානවම්ම රජතුමා මෙන් ම පළමුවන විජයබාහු රජතුමාගේ චරිතවලින් පාසල් දරුවෙකු වන ඔබට ගත හැකි හොඳ ම ආදර්ශය කුමක් ද?
(1) සැලසුම් සහගතව කටයුතු කිරීම
(2) සටන් කරමින් සතුරන් පරාජය කිරීම
(3) දුෂ්කර ජීවිත ගත කිරීමට හුරුවීම
(4) අධිෂ්ඨානය හා ඉවසීම තුළින් අරමුණු කරා ලඟාවීම

(05)
- මිහින්තලේ රෝහලක් කරවීම
- මණිමේඛලා අමුණ ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත කාර්යයන්වලට අදාල රජතුමා කවුරුන් ද?
(1) I සේන රජු (2) II සේන රජු (3) මානවම්ම රජු (4) I මුගලන් රජු

(06) අනුරාධපුර යුගයේ අවසාන කාලයේ භාවිතා වූ 'අත්තානි කණු' නම් වූ ලේඛන වල දක්වා ඇති ප්‍රධාන කරුණ මින් කුමක් ද?
(1) රජුගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යයන් ය.
(2) රජු විසින් දුන් විශේෂ බලතල හා වරප්‍රසාද ය.
(3) අපරාධ නඩු විසඳීමට භාවිතා කළ නීතිරීති ය.
(4) විහාරවලට දිනපතා ලැබෙන ආදායම ය.

(07) පළමුවන විජයබාහු රජු සතු වූ උසස් ගුණාංග පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) දෙවනගල සෙල්ලිපිය (2) වේලෙක්කාර සෙල්ලිපිය
(3) ගල්පොත සෙල්ලිපිය (4) අඹගමුව සෙල්ලිපිය

(08) අතීතයේ රාජසභාව තුළ තනතුරුවලට අදාළව ආසන පනවා තිබූ බවට තොරතුරු හෙළි වන්නේ කුමන ස්ථානයකින් ද?
(1) නිශ්ශංකලතා මණ්ඩපය (2) දුටුගැමුණු රාජසභා මණ්ඩපය
(3) නිශ්ශංකමල්ල රාජසභා මණ්ඩපය (4) සත්මහල් ප්‍රාසාදය

(09) ලංකාවට ඉතා ම සමීපව පිහිටා ඇති දකුණු ඉන්දියානු රාජ්‍යය කවරක් ද?
(1) චෝළ රාජ්‍යය (2) කේරළ රාජ්‍යය
(3) පාණ්ඩ්‍ය රාජ්‍යය (4) කාලිංග රාජ්‍යය

(10) අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා වූයේ,
(1) පළමුවන අග්බෝ රජු ය. (2) දෙවන අග්බෝ රජු ය.
(3) හතරවන මිහිඳු රජු ය. (4) පස්වන මිහිඳු රජු ය.

(11) අපේ සංස්කෘතික උරුම අතරින් අස්පෘශ්‍ය උරුම සඳහන් පිළිතුර තෝරන්න.
(1) ජේතවන ස්තූපය - ථූපාරාම ස්තූපය
(2) ඇම්බැක්ක ලී කැටයම් - පොළොන්නරුව ගල් කැටයම්
(3) උඩරට නැටුම් කලාව - පහතරට නැටුම් කලාව
(4) නිශ්ශංක ලතා මණ්ඩපය - සීගිරි බලකොටුව

(12) යුනෙස්කෝ සංවිධානය ලෝක උරුම නම් කිරීමේ දී සලකා බැලූ කරුණක් දක්වෙන පිළිතුර කුමක් ද?
(1) විශාල මිනිසුන් ප්‍රමාණයක් විසින් නිර්මාණය කරන ලද්දක් වීම.
(2) මානව ඉතිහාසයේ වැදගත් ගෘහ නිර්මාණ ශිල්පයක් හෝ තාක්ෂණික ක්‍රමයක් වීම.
(3) මානව ඉතිහාසයේ එක් යුගයක් අවසන් වන කාලයට අයත් නිර්මාණයක් වීම.
(4) විශාල මුදල් ප්‍රමාණයක් වැයකොට කරන ලද ගෘහ නිර්මාණ ශිල්පයක් වීම.

(13) ගාලු කොටුව පිළිබඳ සඳහන් වන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කළ බලකොටුවකි.
(2) ලන්දේසීන්ගේ ආරක්ෂිත බලකොටුවකි.
(3) කාශ්‍යප රජතුමා විසින් නිර්මාණය කරවන ලද්දකි.
(4) උඩරට පාලකයෙකු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් කරවන ලද්දකි.

(14) දඹදෙණියේ තුන්වන විජයබාහු රජුගේ විශිෂ්ට සේවාවක් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) කාලිංග මාඝ මෙරටින් පන්නා දැමීම.
(2) දඹදෙණියේ දළදා මාළිගාවක් කරවීම.
(3) දේව පතිරාජ ඇමති ලවා රටේ සංවර්ධන කටයුතු කරවීම.
(4) බෙලිගල මාළිගාවක් කරවා දළදා වහන්සේ තැන්පත් කිරීම.

(15) පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන ඉදිකොට ඇත්තේ කුමන රාජධානි සමයේ ද?
(1) කෝට්ටේ (2) දඹදෙණි (3) ගම්පොළ (4) මහනුවර

(16) යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්ති පරම්පරාවේ ආරම්භක පාලකයා කවුරුන් ද?
(1) වරෝදය (2) විජය කුලංගෛ (3) සංකිලි (4) කුලසේකර

(17) කුරුණෑගල යුගයේ සිදු වූ සාහිත්‍ය සේවාවක් වන්නේ මින් කුමක් ද?
(1) සිංහල බෝධි වංශය කෘතිය රචනා කිරීම
(2) සැළලිහිණි සංදේශය රචනා කිරීම
(3) කව් සිළුමිණ කෘතිය රචනා කිරීම
(4) කාව්‍ය ශේඛරය කෘතිය රචනා කිරීම

(18) සුප්‍රසිද්ධ ග්‍රීක වීර කාව්‍ය දෙකක් වන ඉලියඩ් හා ඔඩෙසි හි කර්තෘ කවුරුන් ද?
(1) සොපොක්ලීස් ය. (2) යුරිපිඩීස් ය.
(3) හෝමර් ය. (4) ප්ලේටෝ ය.

(19) බෙත්ලෙහෙමේ දී ජේසුතුමාගේ උපත සිදුවන විට රෝමයේ සිටි පාලකයා කවුරුන් ද?
(1) ජුලියස් සීසර් ය. (2) ඔගස්ටස් සීසර් ය.
(3) තියඩෝසියස් ය. (4) කොන්ස්ටන්ටයින් ය.

(20) රෝම සමාජය තුළ මවට සලකා ඇත්තේ කුමන ආකාරයෙන් ද?
(1) පවුලේ ප්‍රධානත්වය ලබාදීමෙනි.
(2) විශාල බලයක් ලබාදීමෙනි.
(3) ඉහළ තනතුරු වලට පත්කිරීමෙනි.
(4) පූජනීයත්වයෙන් සැලකීමෙනි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) (i) පහත A, B, C යටතේ දක්වෙන පින්තූර සම්බන්ධව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි උඩ ලියා දක්වන්න.

A



1. A පින්තූරයේ දක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
.................................................. (ලකුණු 02)
2. එම ස්ථානය හා සම්බන්ධ රජ කුමරාගේ නම කුමක් ද?
.................................................. (ලකුණු 02)

B



1. B පින්තූරය දක්වෙන නගරය කුමක් ද?
.................................................. (ලකුණු 02)
2. එය අයත් වන්නේ කුමන රටට ද?
.................................................. (ලකුණු 02)

C



1. C හි පින්තූරයේ දක්වෙන විහාරය නම් කරන්න.
.................................................. (ලකුණු 02)
2. එය ලෝක උරුමයක් වී ඇත්තේ කුමන කරුණක් නිසා ද?
.................................................. (ලකුණු 02)

185

(ii) පහත සිතියමේ D, E, F, G වශයෙන් දක්වා ඇති ස්ථානවල නම් නියමිත තිත් ඉර උඩ ලියන්න.



D ........................................................

E ........................................................

F ........................................................

G ........................................................

(ලකුණු 04)

02) (i) අතීතයේ අපේ රටේ පැවති කර්මාන්ත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බදුලු ටැම් ලිපියේ සඳහන් වන වෙළෙඳපළ පාලනය සම්බන්ධ නීති දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) අපේ අතීත සමාජයේ ජනතාව යහපත් ගුණදහමින් යුතුව කටයුතු කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03) (i) අනුරාධපුර යුගයේ පැවති රජ පෙළපත් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මධ්‍ය පාලකයා වශයෙන් රජුට අයත් වූ කාර්යයන් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) මහා විජයබාහු රජු කළ ආගමික සේවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04) (i) මහා පරාක්‍රමබාහු රජු දුදුරු ඔය හරස්කර සෑද වූ අමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත අසා ඇති තොරතුරු ලියන්න.

A. නගරගිරි කිත්ති සෙනෙවියාට ගම්බිම් දීම පිළිබඳ සඳහන් සෙල්ලිපිය -

B. පරාක්‍රමබාහු කුමරා හා දෙවන ගජබාහු රජු අතර ඇති වූ ගිවිසුම සඳහන් ලේඛනය - (ලකුණු 04)

(iii) නිශ්ශංකමල්ල රජතුමා මුහුණදුන් අභියෝග දෙකක් සඳහන් කර ඉන් එකක් ජය ගැනීම සඳහා කටයුතු කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

05) (i) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සංස්කෘතික උරුම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සීගිරියේ දී දක්නට ලැබෙන විශිෂ්ඨ නිර්මාණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අපේ සංස්කෘතික උරුම රැක ගැනීමේ වැදගත්කම පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

06) (i) පහත A හා B යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

A ඉබන් බතුතා ලංකාවට පැමිණියේ කුමන රාජධානි සමයේ ද?

B කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නම් උපාධි නාමයෙන් පිදුම් ලැබුවේ කුමන රජතුමා ද? (ලකුණු 02)

(ii) කෝට්ටේ යුගයේ ආරම්භ වූ පිරිවෙන් දෙකක් හා පඬිවරු දෙදෙනෙක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දඹදෙණිය රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

07) (i) ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය දෙකක නම් ලියන්න. (ලකුණු 02)

(ii) ග්‍රීසියෙන් ලෝකයට උරුම වූ දායාද දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මුල් කාලයේ රෝමයේ පැවති පාලන ක්‍රමය පිළිබඳ වාක්‍ය පහක් ලියා දක්වන්න. (ලකුණු 05)